**ස්ථායිකරණ ක්‍රමවේද මගින් නාය යෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය - 2021**

ස්ථායිකරණ ක්‍රමවේද මගින් නාය යෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය හා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව අතර 2019 අප්‍රේල් 25 දින එළඹි අංක එල් - 0124 ඒ දරන ණය ගිවිසුමේ II ආ (3) පරිච්ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාල සීමාව

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, රාජ්‍ය ආරක්ෂක සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ආපදා අවම කිරීමේ භෞතික ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ නායයෑම් කළමනාකරණ හා සම්බන්ධ ප්‍රතිපත්ති හා රෙගුලාසි වැඩිදියුණු කිරීම තුළින් නායයෑම්වලින් සිදුවන අවදානම් සහ හානි අවම කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 19,976කට සමාන එ.ජ.ඩො මිලියන 110ක් වූ අතර ඉන් රු. මිලියන 14,528කට සමාන එ.ජ.ඩො මිලියන 80 ක් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2019 ජූලි 01 දින ආරම්භ කර තිබුණු අතර 2023 ජූනි 30 දින වනවිට අවසන් කිරීමට නියමිතව ඇත.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් වන විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත වන බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

---

**2.1 රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම**

---

| අංකය | රීති සහ රෙගුලාසි සඳහා යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ මූල්‍ය කළමනාකරණ අත්පොතෙහි V(ll)වන පරිච්ඡේදය | රේඛීය අමාත්‍යාංශයට සෘජුවම වාර්තා කරන වෙනම අභ්‍යන්තර විගණකවරයකු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා පත්කළ යුතුය. කෙසේවෙතත්, විගණනය සිදුකරන ලද 2022 මාර්තු 03 දින වන විටත් බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. | ව්‍යාපෘතියට වෙනම අභ්‍යන්තර විගණකවරයකු බඳවා ගැනීම සඳහා කාර්යය මණ්ඩල අනුමැතිය මේ දක්වා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබී නොමැත. | ව්‍යාපෘතියේ මූල්‍ය කළමනාකරණ ශක්තිමත් කිරීමට ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර විගණකවරයකු බඳවා ගැනීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | චක්‍රලේඛයට අනුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් මාස 02 කට වරක් පැවැත්වීමට අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් 01ක් පමණක් පවත්වා තිබුණි. | ව්‍යාපෘතිය විවිධ හේතූන් නිසා චක්‍රලේඛය ප්‍රකාරව මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීමට අපොහොසත්වී ඇත. | චක්‍රලේඛයේ ඇති උපදෙස් සමඟ අනුකූලවීම අවශ්‍ය වේ. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියකාරකම්වල භෞතික සහ මූල්‍ය ප්‍රගතිය**

ව්‍යාපෘතියේ කාර්යයන්, සංරචක හතරක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්,

(අ) අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම
(ආ) ප්‍රතිපත්ති, ප්‍රමිති සහ ආයතනික ධාරිතාව වැඩි දියුණු කිරීම
(ඇ) අත්‍යාවශ්‍ය පහසුකම් සැපයීම සහ
(ඈ) උපකරණ සහ තාක්ෂණික සහාය සහ ව්‍යාපෘති කළමනාකරණය

ලැබී තිබුණු තොරතුරුවලට අනුව, ව්‍යාපෘතියේ අවසාන දිනට පෙර ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට නොහැකි බව යාවත්කාලීන කරන ලද ක්‍රියාකාරී සැලැස්ම මගින් දක්වා තිබුණි. ඒ පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අංකය | සංරචකය | විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | සංරචක අංක - 01 | සියලුම ප්‍රමුඛතා වැඩබිම් 147 සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ, සවිස්තරාත්මක සැලසුම්, ඉදිකිරීම් සහ අධීක්ෂණ / ඉදිකිරීම් කටයුතු කළමනාකරණය කිරීම ඇතුලුව අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සංරචකයේ අරමුණ වන අතර ඒ සඳහා එ.ජ.ඩො මිලියන 97ක් වෙන් කර තිබුණි. කෙසේවෙතත්, ඉන් වැඩ බිම් 27ක සිවිල් වැඩ කටයුතු, කොන්ත්‍රාත් පැකේජ 04ක් යටතේ එ.ජ.ඩො මිලියන 19.5 ක වටිනාකමකට තක්සේරු කොට 2019 වර්ෂයේ දී ප්‍රදානය කිරීමට තීරණය කරන ලදි. කෙසේවෙතත්, එ.ජ.ඩො මිලියන 5.2ක් වටිනා කොන්ත්‍රාත් පැකේජ 2ක් 2020 වර්ෂයේදී පිරිනමා තිබුණු අතර එ.ජ.ඩො මිලියන 14.3ක් වටිනා අනෙකුත් කොන්ත්‍රාත් පැකේජ 2ක සමාලෝචිත වර්ෂය තුළ ප්‍රදානය කර තිබුණි. | අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් පැකේජ 1,2 සහ 3හි ටෙන්ඩර අවලංගු කිරීම ටෙන්ඩර් ක්‍රියාවලියේදී මුහුණදෙන ලද ප්‍රධාන අභියෝගයක් විය. | ප්‍රමාදයන් වළක්වා ගැනීමට සහ කොන්ත්‍රාත් වැඩ නියමිත කාලය තුළ අවසන් කිරීම තුළින් අතිරේක පිරිවැය මගහරවා ගැනීමට පියවර ගත යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | | වැඩබිම් 120ක ඉතිරි සිවිල් වැඩ කටයුතු කොන්ත්‍රාත් වැඩ පැකේජ 08ක් යටතේ එ.ජ.ඩො මිලියන 60ක වටිනාකමකට තක්සේරු කර 2020 වර්ෂය තුළදී අදියර-2 යටතේ ප්‍රදානය කිරීමට තීරණය කර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ කිසිදු කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර නොතිබුණි. එමනිසා ඉදිකිරීම් කටයුතු ව්‍යාපෘති කාලය තුළ නිමකිරීම අවිනිශ්චිත වේ. | අදියර 1හි සැලසුම් නැවත කිරීමට සිදුවන ඉදිකිරීම් ආරම්භ කිරීම ප්‍රමාදයට හේතුවූ අසීරු ස්ථාන නැවත සක්‍රීය කිරීම අවදානම් අවම කිරීම සැලසුම් කිරීමේ අදියරේදී ප්‍රධාන ගැටලුවක් විය. ඉහත සඳහන් ප්‍රමාදය හේතුවෙන් සැලසුම් කළ පරිදි පැකේජ 4 ප්‍රදානය කිරීමට නොහැකි විය. | ප්‍රමාදයන් වළක්වා ගැනීමට සහ කොන්ත්‍රාත් වැඩ නියමිත කාලය තුල අවසන් කිරීම තුළින් අතිරේක පිරිවැය මගහරවා ගැනීමට පියවර ගත යුතු වේ. |
| (ඇ) | සංරචක අංක - 02 | මෙම සංරචකය ප්‍රතිපත්ති, ප්‍රමිති සහ ආයතනික ධාරිතාව වැඩි දියුණු කිරීම පිළිබඳව යොමුවේ. මෙම සංරචකය යටතේ 2019 හා 2020 වර්ෂයන් තුළ එ.ජ. ඩො මිලියන 3ක් වටිනා උපදේශන සේවා කොන්ත්‍රාත් 03ක් පිළිබඳ දැන්වීම් පළකිරීමට තිබුණි. කෙසේවෙතත්, උක්ත උපදේශන සේවා කොන්ත්‍රාත්තු සමාලෝචිත වර්ෂය තුළ දී පවා ප්‍රචාරණය කර නොතිබුණි. | විගණක සමඟ එකඟ වේ. අනෙකුත් සංරචකවලට වඩා සංරචක 2 විවිධ ඇල්මැති පාර්ශව සමග ක්‍රියාත්මක කළ යුතුවේ. කොවිඩ්-19 සහ වර්තමාන ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස සියලුම ඇල්මැති පාර්ශවන් සහ ප්‍රසම්පාදන කමිටු රැස්කිරීම යම් අභියෝගයක් විය. | ව්‍යාපෘතියේ නියම කර ඇති ඉලක්කවලට අනුගතවීම සඳහා පියවර ගත යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය 2020 නොවැම්බර් රු.මිලියන 860.41 පිරිවැයකට රත්නපුර සහ කළුතර දිසිත්‍රික්වල නායයෑම් අවම කිරීමේ කටයුතු සඳහා කොන්ත්‍රාත් 2ක් පිරිනමා තිබුණු අතර 2021 සැප්තැම්බර් සහ නොවැම්බර් නිමකිරීමට එකඟවී තිබුණි. කෙසේවෙතත්, කොන්ත්‍රාත්කරුගේ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් කොන්ත්‍රාත් කටයුතු 2022 මාර්තු 03 දින වනවිටත් නිමකර නොතිබුණි. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් 2022.02.20 දින පැකේජ 01 භාරගන්නා ලද අතර රඳවාගත් මුදල්වල පළමු අර්ධය නිදහස් කර ඇත. පැකේජ 1 සඳහා ඉංජිනේරුවරයාගෙන් නිමකිරීමේ සහතිකය ලැබීමට නියමිතය. | කොන්ත්‍රාත්කරුගේ කටයුතු කාර්යක්ෂම ලෙස අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| (ආ) | ලැබී තිබුණු තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී පිරිනමන ලද කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 297.1, රු.මිලියන 314.15, රු.මිලියන 213.14 සහ රු.මිලියන 303.99 වටිනා නායයෑම් අවම කිරීමේ කටයුතු සම්බන්ධ කොන්ත්‍රාත්වල 2022 අප්‍රේල් 30 දිනට පිළිවෙලින් සියයට 71, සියයට 11, සියයට 15 සහ සියයට 30ක දුර්වල ප්‍රගතියක් වාර්තා කර තිබුණු අතර ව්‍යාපෘති කාලය තුළ කොන්ත්‍රාත් කටයුතු නිමකිරීම පිළිබඳව අවිනිශ්චි තත්ත්වයක් පවතී. | වැඩබිම්වල අමුද්‍රව්‍ය හිඟය සහ ඉන්ධන හිඟයට ප්‍රතිචාර ලෙස කොන්ත්‍රාත්කරුවන් අදාල පැකේජ සඳහා කාලය දීර්ඝ කිරීම සඳහා කරන ලද සිය ඉල්ලීම පිළිබඳ ඉංජිනේරුවරුන් දැනුවත් කර ඇත. | -එම- |

**3.3 ඌනඋපයෝජිත/ භාවිත නොකළ සම්පත්**

| | විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ භෞතික සහ මූල්‍ය ප්‍රගතිය අසතුටුදායක මට්ටමක පැවතුණි. විස්තරාත්මක පිරිවැය ඇස්තමේන්තුව ඉකුත් වර්ෂය අවසානය වන විට ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙන් එ.ජ.ඩො මිලියන 35.5ක් සහ ශ්‍රී ලංකා රජය අරමුදල්වලින් රු. මිලියන 2,638ක් උපයෝජන කිරීමට අපේක්ෂිත විය. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට මුළු අරමුදල් උපයෝජනයෙන්, ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ අරමුදල්වලින් මුළු වියදම එ.ජ.ඩො මිලියන 3.94ක් සහ ශ්‍රී ලංකා රජයේ අරමුදල්වලින් මුළු වියදම රු. මිලියන 436.04ක් දක්වා ළඟා කරගෙන තිබුණි. | විගණක සමඟ එකඟ වේ. විවිධ හේතූන් නිසා ව්‍යාපෘතියේ භෞතික සහ මූල්‍ය ප්‍රගතිය අසතුටුදායක මට්ටමක පැවතුණි. | ව්‍යාපෘතියේ නියම කර ඇති ඉලක්කවලට අනුගතවීම සඳහා පියවර ගත යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට ඉලක්ක සමඟ සත්‍ය උපයෝජනය සැසඳීමේදී මුළු ඉලක්කගත මුදලින් පිළිවෙලින් ආසියානු යටිතල ආයෝජන බැංකුවේ මුදලින් සියයට 4.87ක් සහ ශ්‍රී ලංකා රජයේ මුදලින් සියයට 7.3ක ප්‍රතිශතයක් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. මන්දගාමී ප්‍රතිලබ්ධීන් හේතුවෙන් බැඳීම් ගාස්තු ලෙස ශ්‍රී ලංකා රජයට එකතුව රු.මිලියන 89.7ක් ගෙවීමට සිදුවිය. | විගණක සමඟ එකඟ වේ. | ව්‍යාපෘතියේ නියම කර ඇති ඉලක්කවලට අනුගතවීම සඳහා පියවර ගත යුතුය. |
| (ඇ) | 2020 සහ 2021 වර්ෂවලදී රු.මිලියන 93ක පිරිවැයකට මිලදීගත් ආරක්ෂිත ලෝහ බහාලුම් (protection iron boxes), 3වී ලිතියම් බැටරි (3v lithium batteries), පීවීසී පයිපිප (PVC pipes), එක්ටෙන්සෝමීටර් (extensometer), ඩේටා ලෝගර් (data logger), ගයිඩ් පයිප් 3 m සහ 50 mm (guide pipe 3m and 50 mm), ඩයමීටර් (diameter) සහ ආරෝපණය කළ හැකි අත් ග්‍රිල් (reachable hand grill) වැනි අයිතම් 8ක් අපේක්ෂිත අරමුණුවලට භාවිත කිරීමකින් තොරව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ගබඩාවල නිෂ්කාර්යව පැවති අතර ලිතියම් බැටරි වැනි අයිතම විශේෂිත ජීව කාලයක් අවසන් වීමෙන් පසුව කල් ඉකුත්වීමට ඉඩ ඇත. | විගණක සමඟ එකඟ වේ. ව්‍යාපෘතිය වත්කම් ආරක්ෂා කිරීමේ ක්‍රමවේදය විධිමත් කරනු ලැබේ. | මූල්‍ය කළමනාකරණ පද්ධතියේ කොටසක් ලෙස දැඩි වත්කම් කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීම අවශ්‍ය වේ. |

**3.4 මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ගැටලු**

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණු තනතුරු 46න් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ කාර්යය මණ්ඩලය නිලධාරීන් 16 දෙනෙකුගෙන් සමන්විත විය. ව්‍යාපෘති ඉංජිනේරු, නායයෑම් විශේෂඥ, භූ තාක්ෂණික ඉංජිනේරුවන් 03 සහ තාක්ෂණික නිලධාරීන් 09 වැනි ප්‍රධාන තනතුරු 2021 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ආසන්න කාලයක් පුරා පුරප්පාඩුව පැවතුණු අතර එය ව්‍යාපෘතියේ කටයුතුවල සුමට ක්‍රියාකාරීත්වයට බලපා තිබුණි. | විගණනක සමඟ එකඟ වේ. ව්‍යාපෘතිය වහාම ඉතිරි කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට පියවර ගනු ලැබේ. | ව්‍යාපෘතියේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා කාර්යය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම අවශ්‍ය වේ. |

**3.5 මතභේදයට තුඩුදෙන කරුණු**

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| ව්‍යාපෘතිය සමග වියදම් ප්‍රතිපූර්ණ අනුපාතයේ නොඑකඟතාවයන් පැවතීම හේතුවෙන් ණය නියෝජිතායතනය විසින් එකතුව එ.ජ.ඩො 64,668.75ක් ප්‍රතිලබ්ධි කර නොතිබුණි. | විගණකගේ අදහස් දැක්වීම සමඟ එකඟවේ. ආසියානු යටිතල ආයෝජන බැංකුව ණය ගිවිසුම සංශෝධනය කිරීමෙන් පසුව නතර කරන ලද එ.ජ.ඩො 64,668.75ක මුදල ප්‍රතිලබ්ධි කිරීමට එකඟවී ඇත. | ණය ගිවිසුම සංශෝධනය කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |